*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය*
*පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 311-325*
*ISSN 1800-1459*

# ශ්‍රී ලංකාවේ උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ රුචිකත්වය සහ පුස්තකාලයීය භාවිතය

**අයි.එම්. නවරත්න**

*ප්‍රධාන පුස්තකාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ. 02, බෙලිහුල්ඔය.*

---

**සාරාංශය**

මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරන ලද්දේ විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර සිසුන්ගේ කියවීමේ රුචිකරුත්වය හා පුස්තකාලයීය භාවිතය පිළිබඳ විමසා බැලීමට යි. පුස්තකාලයීය පොත් භාවිතයේ දී ඔවුන් ඒ සඳහා දැඩි කැපවීමක් ආශාවක් දක්වන්නේ ද යන්නත් එසේ නොමැතිනම් ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන හේතු සාධක මොනවා ද යන්නත් මෙමගින් සොයා බලන ලදී.

මේ සම්බන්ධයෙන් මීටපෙර මෙරට කරන ලද පර්යේෂණයක් පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි වුවත් විදේශීය පර්යේෂණ පරිශීලනය කිරීමෙන් මෙම පර්යේෂණය සැලසුම් කරන ලදී. විශ්වවිද්‍යාලයන් පහළවෙන් විශ්වවිද්‍යාලයන් 03ක් පමණක් තෝරාගෙන එයින් සියලු ම විෂයධාරාවන් ආවරණය වන පරිදි නියැදියක් තෝරාගන්නා ලදී. කියවීමේ රුචියට හා පුස්තකාලයීය භාවිතයට බලපාන හේතු සාධක සොයාබැලීමට සංවෘත ප්‍රශ්නාවලියක් මගින් ලබාගන්නා ලද දත්ත සංඛ්‍යාන ක්‍රමයක් මගින් විශ්ලේෂණය කරන ලදි..

පාඨක අධ්‍යාපනය, වාසස්ථානය, කියවීමට ඇති නිදහස, පුස්තකාලයීය සූචි භාවිතය, පුස්තකාලයීය වර්ගීකරණ ක්‍රම ගැන දැනුවත් භාවය, පුස්තකාලයීය භාවිතය සඳහා ගතකරන පැයගණන, කාර්ය මණ්ඩල සහයෝගය, පුස්තකාලයීය අභ්‍යන්තර පහසුකම, ආදර සබඳතා සහ දේශන සඳහා ගතකරන පැයගණන යන ප්‍රධාන විචල්‍යයන් උපාධි අපේක්ෂකයන්ගේ කියවීමේ රුචිකත්වය හා පුස්තකාලයීය භාවිතය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන බව දත්ත විශ්ලේෂණයෙන් තහවුරු විය.

**කේන්ද්‍රීය වචන:** කියවීමේ රුචිකත්වය, පුස්තකාලයීය භාවිතය, විශ්වවිද්‍යාලයීය පුස්තකාලය, ග්‍රන්ථ වර්ගීකරණය, සූචි භාවිතය

## හැඳින්වීම

උපාධි අපේක්ෂයින් ඔවුන්ගේ උපාධි පාඨමාලාවලට අයත් අධ්‍යයන කටයුතුවල නියැලෙන විට දේශනවලින් ලබාගන්නා දැනුමට අමතර ව බාහිර ව දැනුම් සම්භාරයක් ලබාගැනීම අනිවාර්යෙන් ම කළ යුතු ය. මේ සඳහා පොත්පත් සහ වාරසඟරා පරිශීලනය කිරීම අවශ්‍ය වේ. වර්තමානයේ මුද්‍රිත මාධ්‍යයන්ට අමතර ව මුද්‍රිත නොවන මාධ්‍යයන් තාක්ෂණයේ දියුණුවත් සමග දැනුම ලබාදීම සඳහා පෙරට පැමිණ ඇතිබව පෙනේ. අන්තර් ජාලය, දත්ත බැංකු සහ විද්‍යුත් තැටි වැනි උපාංග තොරතුරු ලබා දෙන මූලාශ්‍රයන් බවට පත්ව ඇත. විශ්ව විද්‍යාලයක් තුළ අධ්‍යයන කටයුතුවල නිරත විද්‍යාර්ථීන්ගෙන්ගේ දැනුම පුළුල් කිරීම සඳහා පුස්තකාලයන් ආශ්‍රයෙන් මෙම මුද්‍රිත හා මුද්‍රිත නොවන මධ්‍යයන් සඳහා විශාල මුදලක් වැයකොට ඔවුන්ට අවශ්‍ය දැනුම් ලබා ගත හැකි පරිසරයක් නිර්මාණය වී ඇත.

සියලු ම උපාධි අපේක්ෂකයින් කියවීමේ රුචිකත්වය හා පුස්තකාලයීය භාවිතය කෙරෙහි කැපවීමකින් ක්‍රියා කළයුතු ය. එය උපාධි අපේක්ෂකයෙකුගේන් බලාපොරොත්තු විය යුත්තකි. එහෙත් විශ්වවිද්‍යාලයීය සිසුන් කියවීමේ රුචිකත්වය හා පුස්තකාලයීය භාවිතය කෙරෙහි දක්වන උනන්දුව එකිනෙකට වෙනස් වන එක් එක් පුද්ගල අභිමතාර්ථ අනුව සිදුවේ. ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා හා භාෂා මාධ්‍යයන් කෙරෙහි ඇති නිපුණතාව මූලික ව පදනම් කරගෙන පොතපත පරිශීලනය කෙරෙහි ඇති කැමැත්ත විවිධාකාර බව පිළිගතයුතු කරුණකි. ඒවගේ ම කියවීමේ රුචිකත්වය එකිනෙකා අතර විවිධාකාර ලෙස අඩු වැඩි වශයෙන් දක්නට ලැබේ. මෙයට ප්‍රධාන වශයෙන් විවිධාකාර හේතු සාධක තිබිය හැක. ඔවුන්ගේ පවුල් පසුබිම්වල ආර්ථික තත්වය, අධ්‍යාපන මට්ටම, පාසැල් අධ්‍යාපනය, ඉගෙනගත් භාෂා මාධ්‍ය හා විෂය ධාරාවන් යන හේතු සාධක ප්‍රධාන වශයෙන් කියවීමේ රුචිකත්වය කෙරෙහි බලපෑ හැක.

එදිනෙදාට නියමිත කාර්ය හා ජීවන රටාව ප්‍රමාණවත් මාසික ආදායමක් නොතිබීම්, මානසික අසහනය සහ ආදර සම්බන්ධතා උපාධි අපේක්ෂකයින් හා පුස්තකාලය අතර දූරස්තකිරීමේ සාධකයක් විය හැක.

කියවීම කෙරෙහි උනන්දුවක් දක්වන පොතපතට ආදරය කරන අයට වුව ද ඔවුන්ගේ නවාතැන්වල හෝ නේවාසිකාගාරවල ඇති පහසුකම් හා පරිසරය, පුස්තකාලය හා ඡදිංචිය අතර ඇති දුර ප්‍රමාණය උපාධි අපේක්ෂයින්ගේ කියවීමේ රුචිකත්වය කෙරෙහි යම්කිසි බලපෑමක් කළහැක. ඊට අමතර ව පුස්තකාලය වල අභ්‍යන්තර සම්පත් සකස් කිරීම් සහ ඔවුන් ව දැනුවත් කිරීම හා කියවීම කෙරෙහි පෙළඹවීම සඳහා යොදාගන්නා උපක්‍රම පිළිබඳ ව ද දැඩි අවධානයක් යොමුකිරීම අවශ්‍ය වේ. මෙවැනි හේතු සාධක උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ රුචිය කෙරෙහි අඩුවැඩි වශයෙන් බලපෑම් ඇතිකරන්නේ ද නැද්ද යන්න සොයාබැලීම හා ඊට අමතර ව වෙනත් ප්‍රධාන කරුණු මේ කෙරෙහි දායක වී ඇද්ද නැද්ද යන්න සොයා බැලීම කාලීන අවශ්‍යතාවකි.

විශ්වවිද්‍යාලයට ඇතුළත්වන උපාධි අපේක්ෂකයින් නිතර ම ස්වයං අධ්‍යයනය කෙරෙහි පුහුණු කරවිය යුතු යි. ඒ මගින් ඔවුන් නිර්මාණශීලී හා ගවේෂණශීලී පුද්ගලයින් වන්නාසේ ම තම විෂය සම්බන්ධයෙන් සන්නද්ධ අයෙකු බවට පත්වේ. උසස් අධ්‍යාපනයේ දී දේශකවරු ඔවුන්ට තරමක මඟපෙන්වීමක් ලබාදිය යුතු ය. උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ දැනුම වැඩිකර ගැනීමේ මාර්ගය එම මාර්ග උපදේශකත්වය මගින් වර්ධනය කරගත යුතු ය. ලෝකය තුළ එදිනෙදා කෙරෙන පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් නිතරම තොරතුරු යාවත්කාලීන වේ. එබැවින් තම දැනුම දේශකයා මත හෝ තමාගේ සටහන් මත පමණක් සීමානොවිය යුතු ය.

## ගැටළුව

ස්වේච්ඡාවෙන් මිනිසුන්ගේ කැමැත්ත හා පුහුණුව කියවීමේ ද්‍රව්‍ය සෙවීම සහ කියවීම සඳහා කාලය කැපකිරීම කියවීමේ රුචිකත්ව යි ( Devarajan, 1994). කියවීමේ

රුචිකත්වය පුද්ගලික ආකල්ප මත රඳාපවතින අතර එය මනුෂ්‍ය වර්ගයාගේ ජීවන රටාවේ අත්‍යවශ්‍ය සක්‍රීය අංගයකි. ස්වභාවයෙන් ම කියවීම කෙරෙහි ඇති කැමැත්ත පුද්ගලයාගෙන් පුද්ගලයාට ඔවුන්ගේ ආකල්ප, බුද්ධිමය තත්වය, සමාජ ස්තර හා වයස අනුව විවිධත්වයක් තිබෙන බව පැහැදිලි ව ම දැකිය හැක. මේ තත්වය උපාධි අපේක්ෂකයින් තුළ ද එයාකාර වේ. ඔවුන්ගේ භාෂාවන් පිළිබඳ ඇති හැකියාව පාඨමාලා සඳහා ඇති අවශ්‍යතාව හා අංගසම්පූර්ණ පුස්තකාලයීය සේවාවන් මෙම රුචිකත්වය විවිධ කිරීමට උපකාර විය හැක. උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ අධ්‍යාපනයේ දී පර්යේෂණ සඳහා අවශ්‍ය නවතම තොරතුරු ලබාගැනීමට කියවීම අත්‍යවශ්‍ය වන අතර කියවීම කෙරෙහි ඇති ස්වාධීන කැමැත්ත ඉහළ මට්ටමක පැවැතිය යුතු ය. එහෙත් එය පහළ මට්ටමක පවතී නම් ඒ සඳහා බලපාන හේතුසාධක තිබිය හැක. එනිසා උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ රුචිකත්වය ඉහළ හෝ පහළ තත්වයක තිබේ ද මේ සඳහා බලපාන හේතුසාධක තිබේ ද යන්න ගැඹුරින් සොයා බැලීම අත්‍යවශ්‍ය බව පෙනේ.

## අරමුණු

(අ) උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ රුචිකත්වය කෙරෙහි බලපාන හේතු සාධක සොයාබැලීම.

(ආ) උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ සටහන් කියවීම සඳහා පමණක් පුස්තකාලය පාවිච්චිකරන්නේ ද යන්න විමසීම.

(ඇ) උපාධි අපේක්ෂකයින්ට ලබාදෙන පුස්තකාලයීය පරිහරණ වැඩ සටහන මගින් ඔවුන්ගේ කියවීමේ රුචිය කෙරෙහි යම්කිසි බලපෑමක් ඇතිකළ හැකි ද යන්න විමසා බැලීම.

(ඈ) උපාධි අපේක්ෂකයින් තුළ පුස්තකාලය වල ඇති විමර්ශන උපකරණ ( reference tools) සහ පුස්තකාලයේ භෞතික සම්පත් හා ඒවායේ සැකැස්ම පිළිබඳ සෑහීමට පත්වන්නේ ද යන්න විමසීම.

(ඉ) උපාධි අපේක්ෂකයින් පුස්තකාලයීය කාර්ය මණ්ඩලයේ සහයෝගය ගැන සෑහීමට පත්වන්නේ ද යන්න සොයාබැලීම.

## ක්‍රමවේදය

සියලු ම උපාධි අපේක්ෂකයින් මෙම පර්යේෂණය සඳහා යොදාගැනීමට අපහසු වූ බැවින් ඒ සඳහා ස්වරායන (stratified) නියැදි ක්‍රමය යොදාගනිමින් අවශ්‍ය නියැදිය තෝරාගන්නා ලදී. ජනගහනය එක් ස්ථරයකට බෙදා ඉන්පසුව අවශ්‍ය නියැදිය තෝරාගන්නා ලදී.

විශ්වවිද්‍යාලයන් පහළවෙන් තුනක් තෝරාගෙන ඉන්පසුව අදාළ ප්‍රධාන පීඨ පහත දැක්වෙන ආකාරයට තෝරාගන්නා ලදී.

මෙම අධ්‍යනයේ පහසුව තකා නියදිය තෝරාගැනීමේ දී එය 250ට සීමාකරන ලදී. මෙම තෝරාගත් නියදිය ස්වරායන ක්‍රමය උපයෝගීකරගෙන පීඨ අනුව බෙදා ගැනීමේ දී එම එක් එක් පීඨ නියෝජනය කරන උපාධි අපේක්ෂක සංඛ්‍යාවේ විශාලත්වය අනුව සමහර පිඨ සඳහා වැඩි සංඛ්‍යාවක් ලබාගන්නා විට තවත් සමහර පීඨවලට කුඩා සංඛ්‍යාවක් ලැබුණි. පීඨ අනුව වෙන්කරන ලද සංඛ්‍යාව එම පීඨවල වසර අනුව සමානුපාතික ව බෙදාගත් අතර සමානුපාතික ව නොබෙදුණු අවස්ථාවල වැඩි සංඛ්‍යාව ප්‍රථම වසර සිසුන් සඳහා ලබාදෙන ලදී. එය සමහර අවස්ථාවල ප්‍රථම වසර දෙවන වසර හෝ තෙවන වසර දක්වා ද ලබාදීමට සිදුවිය. මේ ආකාරයට නියදිය තෝරා ගැනීම සඳහා භාවිත කරන ලද ක්‍රමවේදය වගු අංක 1 දක්වා ඇත.

## නියදිය තෝරාගැනීම

මෙහි දී සාධාරණ ලෙස නියදිය තෝරාගත් ආකාරය පහත වගු අංක 1න් දක්වා ඇත.

**වගු අංක 1: නියදිය තෝරා ගැනීම**

| පීඨය | ජනගහනය | තෝරාගත් විධිය | නියදිය | 1 වසර | 2 වසර | 3 වසර | 4 වසර |
|---|---|---|---|---|---|---|---|
| කලා | 1925 | 1925 / 9152 × 250 | 53 | 14 | 13 | 13 | 13 |
| විද්‍යා | 1716 | 1716 / 9152 × 250 | 47 | 12 | 12 | 12 | 11. |
| වෛද්‍ය විද්‍යා | 1349 | 1349 / 9152 × 250 | 36 | 9 | 9 | 9 | 9 |
| කළමනාකරණ | 1174 | 1174 / 9152 × 250 | 32 | 8 | 8 | 8 | 8 |
| කෘෂිකර්මය | 157 | 157 / 9152 × 250 | 05 | 2 . | 1 | 1 | 1 |
| නීතිය | 797 | 797 / 9152 × 250 | 22 | 6 | 6 | 5 | 5 |
| ඉංජිනේරු | 2034 | 2034 / 9152 × 250 | 55 | 14 | 14 | 14 | 13 |
| ජනගහනය | 9152 | නියදිය | 250 | 65 | 63 | 62 | 60 |

ප්‍රථමයෙන් ම උපාධි අපේක්ෂයින් 250 දෙනෙක් සියලු ම පීඨ නියෝජනය වන ආකාරයෙන් තෝරාගත් විශ්වවිද්‍යාලයන් තුනෙන් මෙම පර්යේෂණයේ පහසුව සඳහා තෝරාගන්නා ලදී. තෝරාගත් නියදිය ඉහත වගුව අනුව හැම පීඨයක් අනුව බෙදා නැවත අධ්‍යයන වර්ෂ අනුව බෙදාගන්නා ලදී.

## දත්ත ලබාගැනීම

දත්ත ලබාගන්නා මෙවලම ලෙස ප්‍රශ්නවලී ක්‍රමය තෝරාගත් අතර එය සිසුන් කිහිපදෙනෙකු අතර බෙදා නියමු අධ්‍යයනයක් (pilot study) කරන ලද අතර එය සංවෘත ප්‍රශ්නාවලියක් ලෙස සකස්කරන ලදී.

## පර්යේෂණ සීමාවන්


දැනට ශ්‍රී ලංකාව තුළ මෑතකාලයේ ආරම්භකරන ලද විශ්වවිද්‍යාලයන් ඇතුළු ව ජාතික විශ්වවිද්‍යාලයන් 15ක් ඇති අතර එම විශ්වවිද්‍යාලයන් වල උපාධි පාඨමාලාවන් රැසක් තිබුණත් සමහර ඒවා එකිනෙකට සමානකමක් දක්වන අතර තවත් ඒවා අසමාන කමක් දක්වයි. පොදුවේ සියලු ම විෂයධාරාවන් ආවරණය වන පරිදි කොළඹ විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ සබරගමුව විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලයන් තුන පමණක් මේ සඳහා තෝරාගන්නා ලදි. මෙම විශ්වවිද්‍යාලයවලින් පොදු විෂයධාරාවන් ආවරණය වන පරිදි පමණක් පීඨ වශයෙන් තෝරා ගන්නා ලදී. උදා: කලා, විද්‍යා, වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, කළමනාකරණ, නීතිය සහ කෘෂිවිද්‍යා. ඉහත පාඨමාලාවන් හදාරණ අභ්‍යන්තර සිසුන් පමණක් මේ සඳහා තෝරා ගන්නා ලදී.

වගු හා ප්‍රස්තාර ඉදිරිපත් කිරීමේ දී හා දත්ත විශ්ලේෂණයේ දී යොදාගන්නා ලද විශ්ලේෂණ ක්‍රම ඉදිරිපත් කිරීමේ දී ඒවාට අදාළ ඉංග්‍රීසි වචන ඒ ආකාරයෙන් යොදාගන්නා අතර අවශ්‍ය පැහැදිලි කිරීම් සිංහල භාෂාවෙන් වෙන ම දක්වා ඇත.

## දත්ත විශ්ලේෂණය

ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා "Minitab" නැමැති පරිගණකගත සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන එමගින් කයි වර්ගය (chi-square) සහ අනුපිය ප්‍රතිපායනය (stepwise regression) දත්ත විශ්ලේෂණය ක්‍රමයෙන් අවශ්‍ය ප්‍රතිඵලයන් ලබාගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡා





**ප්‍රස්තාර අංක 1: පුස්තකාලයීය භාවිතය**

ප්‍රථම පැනයෙන් ම උපාධි අපේකෂකයින්ගෙන් ඔවුන්ගේ පුස්තකාලයීය භාවිතය ගැන විමසන ලදී. ඔවුන්ගෙන් 82% පුස්තකාලය, කියවීම සඳහා භාවිතා කරන බව පැවසූ නමුත් 18%ක් ප්‍රකාශකර තිබුණේ කියවීම සඳහා පුස්තකාලය භාවිතා නොකරන බව යි. ඉහත ප්‍රස්තාර අංක 1 මගින් එය පැහැදිලි ව දක්වා ඇත.

පුස්තකාලයීය වර්ගීකරණ ක්‍රමය ගැන විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ ඔවුන්ගේ ආකල්ප (attitude) සහ මතය (opinion) පිළිබඳ ව විමසීමක් කරන ලදී. කියවීමේ රුචිකත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන හේතුසාධකයක් ලෙස මෙය සැලකිය හැක. ඔවුන්ට අවශ්‍ය පොත් නිසිපරිදි සකස්කර තිබේ නම් පාඨකයාට ඉක්මනින් අවශ්‍යතාව කෙරෙහි ළඟාවිය හැකිනම් එය කෙරෙහි යම්කිසි බලපෑමක් කළහැක.

පුස්තකාලයීය පොත් වර්ගීකරණ ක්‍රමය ගැන විමසූ විට 52% ප්‍රකාශකර ඇත්තේ එය කියවීමේ රුචිය කෙරෙහි බලපාන බව යි. උපාධි අපේක්ෂකයින්ගෙන් 32% එය උදව්නොවන බව පවසන විට තවත් 16% පොත් වර්ගීකරණ ක්‍රමය ගැන අවබෝධයක් නැතිබව පවසා ඇත (ප්‍රස්තාර අංක 2).




**ප්‍රස්තාර අංක 2: පොත් වර්ගීකරණ ක්‍රමය ගැන ආකල්පය**


මෙම වර්ගීකරණ ක්‍රමයේ මතය විමසීමේ දී 53% මෙම ක්‍රමය හොඳ බව ද 31%ක් මෙය අවුල්සහගත බව ද 16% මේ පිළිබඳ අවබෝධයක් නොමැති බව ද ප්‍රකාශකර ඇත.

සියලු ම උපාධි අපේක්ෂකයින්ට පුස්තකාලයීය පොත් සංවිධානය කර ඇති ක්‍රමය හෙවත් පොත් වර්ගීකරණය ගැන මනා දැනුමක් තිබීම අත්‍යවශ්‍යය ම කාරණයකි. එමඟින් ඔවුන්ට අවශ්‍ය වන පොත් තබා ඇති ස්ථානය නිවැරදි ව ම හඳුනාගත හැකිවන අතර ඒ සඳහා හැකි ඉක්මනින් ළඟාවිය හැක. පාඨක අධ්‍යාපනය මගින් එය ලබාදීම සඳහා විශ්වවිද්‍යාලයීය බලධාරීන් පුස්තකාලයීය කාර්ය මණ්ඩලය එක්ව මේ සඳහා මහත් කැපවීමක් කරනු ලබයි. එහෙත් සමහරුන් මෙය අවබෝධ කරගැනීමට උත්සහා දරා නැති බව ලබාගත් දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි වේ.

පුස්තකාලයීය සූචිය (catalogue) යනු පුස්තකාලයීය පොත්පත්වල විස්තර ඇතුළත් මෙවලමකි. එය පුස්තකාලයීය පොත් කරා ළඟාවීමට පාඨකයාට ග්‍රන්ථනාමය හා කතෘ ආදී දළ තොරතුරක් ලබා ගැනීමටත් එය ඇති අදාළ ස්ථානය නිශ්චිත ව සොයා ගැනීමට හේතු වේ. මේ සම්බන්ධයෙන් උපාධි අපේක්ෂකයින් 41. 6% ප්‍රකාශ කර ඇත්තේ එවැනි මෙවලමක් පාවිච්චි කිරීම පහසු බවයි. එහෙත් 43. 6% එය අපහසු ක්‍රියාවක් බවත් 14. 8% ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැති බවත් පවසා ඇති අතර එකී අගයන් ප්‍රස්තාර අංක 3 හි දක්වා ඇත.

විශ්වවිද්‍යාලයීය පුස්තකාලයීය පොත් එකතුව ගැන විමසා බැලීමේ දී එය විවිධ පාඨක අවශ්‍යතාවන්ට අවශ්‍ය වන පරිදි ප්‍රතිග්‍රහණය කරන බැවින් විශාල පොත් ප්‍රමාණයක් පුස්තකාලයේ අභ්‍යන්තරයේ විවිධ තැන්වල ස්ථානගත කොට ඇත. මෙය වාර්ෂික ව වර්ධනය වන හෙයින් පුස්තකාලය නිතර ම වැඩෙන ආයතනයකි. එනිසා මෙහි විශාල එකතුවක් දක්නට ලැබේ. මෙනිසා පාඨකයාට අවශ්‍ය පුස්තකාලයීය ද්‍රව්‍ය තෝරා ගැනීමේ දී යම්කිසි විධිමත් යාන්ත්‍රණයක් තිබීම හා ඒ පිළිබඳ අවබෝධයක් තබීම අත්‍යවශ්‍ය වේ. එයින් සෑම පාඨකයෙකුට ම පොතක් සහ සෑම පොතකට ම පාඨකයෙක් යන සංකල්පයට යම්කිසි පිටුවහලක් වේ.

මේ සඳහා ලෝකයේ පිළිගත් සම්මතයන්ට අනුව නිර්මාණය කරන ලද පුස්තකාලයීය සූචි (catalogue) දක්නට ලැබේ. එමගින් පොතක දළ විස්තරයක් එයට අඩංගු කොට පාඨක පහසුව සඳහා අනුක්‍රමණිකාවක ආකාරයට සකසා ඇති මෙය ප්‍රධාන වශයෙන් පොත් සඳහා ප්‍රවේශ වන ඉතා පහසු මෙවලමක් වශයෙන් සඳහන් කළ හැක. මේ පිළිබඳ දැනුවත් වන පාඨකයාට කාලය ඉතිරි කරගනිමින් නියමාකාර පුස්තකාලයීය සම්පත් වෙත යොමුවිය හැක. මේ පිළිබඳ දැනුවත්භාවය පොත් පරිශීලනය හොඳ මට්ටමක ගෙනයාමට උපකාර විය හැක. පුස්තකාලයීය සූචිය පුස්තකාලයක පොත් තෝරා ගැනීම සඳහා ඇති විද්‍යාත්මක හා තාක්ෂණික පද්ධතියක් වගේ ම එය කියවීමේ ආශාව ඉහළ දැමීමට උපකාර වේ (Otike, 1999.)





ප්‍රස්තාර අංක 3: පුස්තකාලයීය සූචි භාවිතය

විශ්වවිද්‍යාලයට ප්‍රථමයෙන් ම ඇතුළත්වන නවක සිසුන් සඳහා පුස්තකාලය පරිහරණය පිළිබඳ මූලික දැනුමක් සෑම විශ්වවිද්‍යාලයීය පුස්තකාලයක ම අනිවාර්යෙන් සිසුන්ට ලබාදීම සිදුකරනු ලබයි. එය පුස්තකාලයීය භාවිතය ඉහළ නැංවීම උදෙසා සකස්කරන ලද්දකි. මේ සඳහා සියලු ම සිසුන් සහභාගි කරවිය යුතු ය. එහෙත් මෙම අධ්‍යයනයේ දී සිසුන්ගෙන් 72% පමණක් එයට සහභාගී වී ඇති අතර ඉතිරි අය ඒ සඳහා සහභාගී වී නොමැත.

මෙහි ඇති වැදගත්කම ගැන සොයාබැලීමේ දී 42% ට මෙය වැදගත් විය. මෙහි කිසිම වැදගත්කමක් නැතිබව 45% පවසන විට 7% පවසා ඇත්තේ මෙම වැඩසටහන ව්‍යාකූල බව යි. මෙම පුස්තකාලයීය පාඨක අධ්‍යාපනය ලබාගත් පිරිසගේ පුස්තකාලයීය භාවිතය එය ලබානොගත් පිරිසට වඩා හොඳ ප්‍රවණතාවක් දක්නට ලැබෙන අතර එය කියවීමේ රුචිකත්වය කෙරෙහි බලපෑමක් ඇතිකරන සාධකයක් බවට පත් ව ඇත. පුස්තකාලය ගැන දැනුවත්භාවයෙන් සිටීම සහ ඒ පිළිබඳ සිතේ ඇතිවන චිත්‍රය පුස්තකාලයීය සම්පත් හා පාඨකයා අතර ඉතා හොඳ සබඳතාවක් ඇති කරයි (Shoham and Yatzhaki, 1991).

දැනට ශ්‍රී ලංකාවේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී යම්යම් බාධක දක්නට ලැබේ. විශේෂයෙන් ම භාෂාමය බාධක හා ඒ සඳහා ලැබෙන කාලය ප්‍රධාන වශයෙන් ම බලපාන ලබයි. මෙම වැඩසටහන ප්‍රථම වසරට පමණක් සීමා නොවී දිගින් දිගට ම විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ලබන කාලයේ සෑම වසරක ම මෙය ලබාදීම කියවීමේ රුචිය ඉහළ තලයට ගෙන යා හැකි ප්‍රධාන සාධකයක් බවට එය පත්කළ හැකි යි (Rathnayake, 2004).

මෙම අධ්‍යනයේ දී පුස්තකාලයවල වැඩි වශයෙන් උපාධි අපේක්ෂකයින් කියවීමට රුචියක් දක්වන්නේ කිනම් මාධ්‍යක් කියවීමට ද යන්න සොයා බලන ලදී. ඒ අනුව වැඩි සිසුන් ප්‍රමාණයක් 43. 6% ඔවුන්ගේ දේශන සටහන් කියවීම සඳහා පුස්තකාලය භාවිත කරති. පොත් සහ වාර සඟරා කියවීමට සිසුන්ගේ 38. 2% ක් සහ 18. 2%ක් පිළිවෙළින් පුස්තකාලය භාවිත කරති. මේ දත්තයන් ප්‍රස්තාර අංක 4 මගින් එය පැහැදිලි ව දක්වා ඇත.





ප්‍රස්තාර අංක 4: කියවීමට රුචියක් දක්වන මාධ්‍යන්

මෙයින් දේශන සටහන් පමණක් පුස්තකාලය තුළ කියවීමට කැමැත්තක් දක්වන ශිෂ්‍යයන් සතියකට පැය 814 දක්වා කාලයක් වැය කරන සංඛ්‍යාව 43. 2% කි. පැය 07 ක කාලයක් ගතකරන ශිෂ්‍ය සංඛ්‍යාව 31. 6% ක් වන අතර සිසුන්ගෙන් 25. 2% පිරිසක් පැය 15-21 කාලයක් ඒ සඳහා වැයකරති.

වාර සඟරා පමණක් කියවීමේ අරමුණෙන් පුස්තකාලය භාවිත කරන සිසුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් 66% සතියකට පැය 04 දක්වා කාලයක් පුස්තකාලයේ ගතකරන අතර වැඩි පැය ගණනක් වැයකරන ප්‍රමාණයේ විශාල අඩුවක් දක්නට ලැබේ. එය 12%ක් තරම් අඩු ප්‍රතිශතයකි.

පුස්තකාලයීය පොත් කියවීම සඳහා භාවිත කරන උපාධි අපේක්ෂකයින්ගෙන් 50. 4% ක් සතියකට පැය 9-16 කාල පරාසයක් මේ සඳහා වැයකරනු ලබයි. සතියකට පැය 08ක් සහ පැය 17-24ක ප්‍රමාණයක් ගතකරන සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිවෙළින් 46.4% සහ 3. 2%ක්වේ. පොත් කියවීමට වැඩි පැයගණනක් ගතකරන සංඛ්‍යාවේ විශාල පසුබෑමක් දක්නට ඇත.

උපාධි අපේක්ෂකයින්ගේ බහුතරයක් (44%) පුස්තකාලය සිය දේශන සටහන් කියවීමට භාවිත කරන බව දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි විය (ප්‍රස්තාර අංක 5). ඉතිරි සිසුන්ගෙන් 38% ක් පොත් කියවීමටත් 18%ක් වාරසඟරා කියවීමට පුස්තකාලය භාවිත කොට ඇත.




**ප්‍රස්තාර අංක 5: කියවීමට ගත කරන කාලය**

මෙයින් පැහැදිලි වන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ පොත් කියවීමට වඩා සිය දේශන සටහන් කියවා උපාධි පරීක්ෂණ සමත් වීමට උත්සාහ දරන බව යි. ඒවගේ ම ඒ කෙරෙහි ඔවුන්ගේ ඇති විශ්වාසය තහවුරු වන ආකාරය මෙයින් සමාන වේ. ඊට අමතර ව දේශන සටහන් පමණක් කියවන සිසුන් ඔවුන් සතියකට ඒ සඳහා වැයකරන කාල පරාසය ඉතා ම ඉහළ තත්වයක් ගනී.

පොත් සහ වාරසඟරා වැඩිපුර කියවීම සහ ඒ මගින් අමතර දැනුමක් උකහාගැනීම විශේෂයෙන් ම අත්‍යවශ්‍ය යි. එහෙත් මේ සඳහා අඩු නැඹුරුතාවක් දැක්වීම කොහෙත් ම බලාපොරොත්තු නොවිය යුත්තකි. මෙම පොත් සහ වාර සඟරා කියවීමට පුස්තකාලය භාවිත කරන උපාධි අපේකෂකයින් ඒ සඳහා ඔවුන් සතියකට ගතකරන කාල පරාසයේ ද අඩු ප්‍රවණතාවක් දැකිය හැක.

දේශන සටහන් කියවීම පොත් කියවීම සහ වාරසඟරා පරිශීලනය කිරීම සඳහා පුස්තකාලය භාවිත කරන සංඛ්‍යාවේ ප්‍රතිශතයන්ට ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඔවුන් සතියක කාලයක් ඇතුළත ඒ ඒ කාර්යන් සඳහා ගතකර කාලපරාසයන් තුලනාත්මක ව අධ්‍යයනය කළහැකි පරිදි ඉහත ප්‍රස්තාරවලින් පැහැදිලි වේ.

උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ රුචිය සම්බන්ධයෙන් මෙරට කරනලද පර්යේෂණ දක්නට නැතත් ගුරුවිද්‍යාලයීය සිසුන්ගේ කියවීමේ රුචිය සම්බන්ධයෙන් එක් පර්යේෂණයක් පමණක් සිදුකොට ඇත (Silva, 1978) එහි දී දිනකට පැය 56 ප්‍රමාණයක් ඔවුන් කියවීම සඳහා වැයකොට ඇති බව සදහන් වේ. ඒ අනුව විශ්වවිද්‍යාලයීය සිසුන්ට වඩා ඔවුන්ගේ කියවීමේ රුචිකත්වය ඉහළ තත්වයක පවතී.

කියවීමේ රුචිය අඩුකිරීම කෙරෙහි හා පුස්තකාලයීය භාවිතය කෙරෙහි විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ ආදර සම්බන්ධතා යම් බලපෑමක් කර ඇති බව පෙනේ. ආදර සම්බන්ධතා ඇති සිසුන් හා පුස්තකාලය පාවිච්චි කිරීම පිළිබඳ කයි (chi-square) මගින් පරීක්ෂාකිරීමේ දී ආදර සබඳතා ඇති සිසුන් හා කියවීම රුචිය අතර සබඳතාවක් දක්නට ලැබෙන බව පහත වගුවේ ඇති ප්‍රතිඵලවලින් පැහැදිලි වේ.

**වගු අංක 2: ආදර සම්බන්ධතා**

Rows: Reading Columns: Love affair

| | 1 | 2 | All |
|---|---|---|---|
| 1 | 87 | 114 | 201 |
| 2 | 12 | 37 | 49 |
| All | 99 | 151 | 250 |


Chi-Square= 5.8818, Df = 1,P-Vlue = 0.016
1 cells with expected counts less than 5.0
Since P value is less than 0.05 we reject Ho at 5% level of significance.

1 cells with expected counts less than 5.0 Since P value is less than 0.05 we reject Ho at 5% level of significance.

වගු අංක 2න් පැහැදිලි වන්නේ කියවීම හා ආදර සබඳතා අතර සබඳතාවක් ඇති බැවින් එය කියවීමේ රුචිකත්වය කෙරෙහි බලපෑමක් සිදුකොට ඇති බව යි.

පුස්තකාලය තුළ ඇති පරිසරය පාඨකයාට පොත් කියවීම කෙරෙහි යම්කිසි බලපෑමක් කළ හැක. සිත් ඇදගන්නා සුළු සහ ප්‍රසන්න පිරිසිදු පරිසරය නිරන්තරයෙන් ම පාඨකයා එහි රැඳවීමට පෙළඹවීමක් කළහැක. පුස්තකාලය වල ඇති සංවාහනය (ventilation) පිළිබඳ විමසීමේ දී ශිෂ්‍යන්ගෙන් 63%ක් ප්‍රකාශ කර ඇත්තේ තමන් සෑහීමකට පත් නොවන බව යි. මෙනිසා ක්‍රමවත් පුස්තකාලයන් සඳහා ම පවතින සම්මතයන්ට අනුව පුස්තකාලයීය ගොඩනැගිලි ඉදිකිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතු ය.

උපාධි අපේක්ෂකයින්ගේ පුස්තකාලය භාවිතයේ දී සමහර අවස්ථාවේ දී එහි කාර්ය මණ්ඩලයේ සහයෝගය අවශ්‍ය වන අවස්ථාවන් දක්නට ලැබේ. පුස්තකාලයට ඇතුළු වෙන පාඨකයා සමහර විට ඔවුනට එය නැවුම් ස්ථානයක් විය හැක. එහි දී ඔවුනට තොරතුරු ලබා ගැනීමට යොමුගත වන ක්‍රමයේ අපහැදිලි අවශ්‍ය තැන්වල දී කාර්ය මණ්ඩලය උපකාරී විය යුතු ය. නමුත් කාර්ය මණ්ඩල සහයෝගය ගැන පාඨකයාගේ ආකල්පය සතුටුදායක නැතිබව පහත ප්‍රස්තාර අංක 6 න් තහවුරු වේ.




**ප්‍රස්තාර අංක 6: කාර්ය මණ්ඩලීය සහයෝගය**

පාඨකයා හා කාර්ය මණ්ඩලය අතර වාණිජ මධ්‍යස්ථානයකට පැමිණෙන පාරිභෝගිකයන්ට එකී මධ්‍යස්ථානයේ සේවකයින් තම වාණිජමය අවශ්‍යතාවක් සපුරාගැනීම සඳහා පාරිභෝගිකයා සෑහීමකට පත්වන අකාරයෙන් ක්‍රියාකරන ආකාරය වාණිජ ලෝකයේ දක්නට ලැබෙන සුලභ දර්ශනයකි. ලාභ නොලැබෙන සේවාවන් මූලික පදනම ලෙස සාක්ෂාත් කිරීමට උත්සහා දරන පුස්තකාලයක් තුළ පාඨකයා හා කාර්ය මණ්ඩලය අතර හොඳ සබඳතාවක් ගොඩනැගීම අත්‍යවශ්‍ය ම දෙයකි. එය ගුණාත්මක තොරතුරු සමුද්ධරණයේ දී වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

දත්ත විශ්ලේෂණයේ දී ප්‍රශ්නාවලියෙන් ලබාගත් සියලු ම විචල්‍යන්ට අයත් දත්ත තවදුරටත් පුස්තකාලයීය භාවිතය හා කියවීම කෙරෙහි බලපාන ප්‍රධානතම කරුණු මොනවා ද යන්න සොයාබැලීම සඳහා සංඛ්‍යාන ක්‍රමයේ එන අනුපිය ප්‍රතිපායනය ක්‍රමය භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදී. සියලු ම විචල්‍යන් අතුරින් ප්‍රධාන වශයෙන් ම අදාළ පුස්තකාලය කෙරෙහි වැඩි වශයෙන් ම බලපාන විචල්‍යන් 06 දක්නට ලැබුණු අතර ඒවා පහත වගු අංක 3හි ලබාගත් ප්‍රතිඵලත් සමඟ දක්වා ඇත.

වගු අංක 3: කියවීමේ රුචිකත්වය කෙරෙහි බලපාන විචල්‍යයන්

| Step | 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|---|
| Constant | 0.6978 | 0.8709 | 0.6809 | 0.8522 | 0.8208 | 0.7432 |
| වර්ගීකරණ ක්‍රමය ගැන ආකල්පය | 0.267 | 0.659 | 0.573 | 0.556 | 0.501 | 0.502 |
| T-Value | 12.62 | 19.56 | 15.85 | 15.95 | 12.86 | 13.05 |
| වර්ගීකරණ ක්‍රමය ගැන මතය | | 0534 | 4.467 | 0.426 | 0.388 | 0.384 |
| T-Value | | 13.27 | 11.54 | 10.72 | 9.43 | 9.44 |
| කාර්ය මණ්ඩලය සහයෝගය | | | 0.167 | 0.153 | 0.146 | 0.148 |
| T-Value | | | 5.17 | 4.94 | 4.74 | 4.87 |
| පාඨක අධ්‍යාපනය | | | | 0.148 | 0.191 | 0.190 |
| T-Value | | | | 4.80 | 5.67 | 5.72 |
| පාඨක අධ්‍යාපනයේ වැදගත්කම | | | | | 0.083 | 0.091 |
| T-Value | | | | | 2.93 | 3.24 |
| පුස්තකාලයේ ගතකරන කාලය | | | | | | 0.0060 |
| T-Value | | | | | | 2.75 |
| S | 0.298 | 0.228 | 0.217 | 0.208 | 0.205 | 0.202 |
| R-Sq | 39.12 | 64.47 | 67.95 | 70.71 | 71.70 | 72.56 |

## නිගමනය

පර්යේෂණය සඳහා යොදාගත් සිසුන්ගෙන් සියයට අසූ දෙකක ප්‍රමාණයක් (82%) පුස්තකාලය කියවීම සඳහා භාවිත කරන බව තහවුරු විය. නමුත් කියවීම සඳහා පුස්තකාලය භාවිත නොකරන යම්කිසි ශිෂ්‍ය ප්‍රමාණයක් දක්නට ලැබීම ගැන වැඩි අවධානයක් යොමු කළ යුතු ය. උසස් අධ්‍යාපනය හදාරන සියලුම සිසුන් අනිවාර්යෙන් ම පුස්තකාලය පරිශීලනය කළ යුතු ය. එසේ නොවන කල්හි ඒ සම්බන්ධයෙන් ඇති ගැටළු අධ්‍යයනය කොට සෑම සිසුවෙක් ම පුස්තකාලයීය පරිශීලනය කෙරෙහි යොමු කළ හැකි ක්‍රියාමාර්ගත යුතු ය.

විශ්වවිද්‍යාලයීය සිසුන්ගේ කියවීමේ රුචිකත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් ම බලපාන විචල්‍යයන් කෙරෙහි දැඩි අවධානයක් යොමුකළ යුතු ය. ප්‍රථම වසර විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාලයවලට ඇතුළු වීමේ දී ඔවුන්ට ලබාදෙන විශ්වවිද්‍යාලයීය නම්‍යකරණ වැඩසටහනේ කොටසක් වශයෙන් පුස්තකාලය ද හඳුන්වාදෙනු ලබයි. එහෙත් එය එතරම් ප්‍රායෝගික ක්‍රියාවක් නොවන බව මෙම අධ්‍යයනයේ දී ඉතා ම පැහැදිලි විය.

ඔවුන්ට මෙම වැඩසටහන ප්‍රදානය කිරීම සඳහා වෙන්කරන කාලය සහ එය ලබාදෙන කාල පරිච්ඡේදයේ යම් වෙනසක් ඇතිකළ යුතු යි. ඔවුන්ගෙන් ලද දත්තයන්ට අනුව සමහරුන් මෙයින් නිසි ප්‍රයෝජනයක් ලබාගෙන නැත.

මෙම වැඩසටහන සම්පාදනය කිරීමෙහිලා ප්‍රධානතම බලාපොරොත්තුව වශයෙන් සලකනු ලබන්නේ පුස්තකාලයේ ඇති සම්පත් පරිශීලනය කිරීම සඳහා එහි ඇති තාක්ෂණික මෙවලම් උපයෝගි කරගන්නා ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීම යි. එහෙත් දත්ත විශ්ලේෂණයේ දී මේ පිළිබඳ යම්කිසි ගැටළු පවතින බව සනාථ වී ඇත. විශේෂයෙන්ම මෙම වැඩ සටහන සඳහා ලබාදෙන කාලපරාසය හා වකවානුව පිළිබඳ යම් වෙනසක් ඇති කළ යුතු ය.

එබැවින් මෙය එක වසරකට පමණක් සීමා නොවී සෑම වසරක ම ශිෂ්‍යන් දැනුවත් කිරීමට හැකිවන පරිදි විෂය මාලාවේ ම කොටසක් බවට පත්කොට එයින් ලද දැනුම පිළිබඳ යම්කිසි ඇගයීමක් කළයුතු ය. විශ්වවිද්‍යාලයීය පුස්තකාලය තුළ දැනුම කළමනාකරණය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සකස්කරන ලද වර්ගීකරණ ක්‍රමයක් භාවිත කරයි. එකී ක්‍රමය මගින් එක්එක් විෂයන්ට අදාළ අංකන ක්‍රමයක් භාවිත කරමින් එක් විෂයක් තවත් විෂයකින් වෙන්කරමින් පාඨක පහසුව තකා වර්ගකොට ඇත. එය පුස්තකාලයීය වර්ගීකරණ ක්‍රමය ලෙස හඳුන්වනු ලබයි.

පොත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සහ වර්ගීකරණ ක්‍රමයේ අංක යොදා ගනිමින් පුස්තකාලයීය සූචිය සකස්කරනු ලබයි. මෙම වර්ගිකරණ ක්‍රමය හා සූචිය පිළිබඳ ශිෂ්‍යයන් නිසියාකාර ව දැනුවත් කිරිම කියවීමේ රුචිය ඉහළ නැංවීමට හේතු සාධක වන බැවින් විධිමත් ක්‍රමවේදයක් මේ සඳහා සකස් කිරීමෙන් මේ සම්බන්ධයෙන් ඇති ව්‍යාකුලතාවන් මඟහැරිය හැක.

සිය දේශන සටහන් කියවීමට පමණක් පුස්තකාලය භාවිතකරන පාඨකයා පුස්තකාලයීය සම්පත් පරිශීලනය කෙරෙහි නැඹුරු කරවීම කෙරෙහි යම් අධ්‍යයනයක් කිරීම කාලීන අත්‍යවශ්‍ය කරුණකි. නවතම කරුණු සෙවීම සහ පර්යේෂණ කරවීමටත් ඒවාට අවශ්‍ය විමර්ශන පුස්තකාලයන් පරිශීලනයෙන් ලබාගැනීම කෙරෙහිත් ශිෂ්‍යන් පෙළඹවීම කෙරෙහි විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන්ගේ අවධානය යොමුවිය යුතු ය.

විශ්වවිද්‍යාලයීය සිසුන් පුස්තකාලය භාවිත කරන කාලපරාසයෙන් වැඩිකාලයක් සිය දේශන සටහන් කියවීම සඳහා කැප කරන පාඨකයා නවතම දැනුම ලබාදෙන පොත් සහ වාර සඟරා කියවීමට අඩුකාලයක් කැපකිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතු ය. විශේෂයෙන් ලෝකයේ කෙරෙන නවතම පර්යේෂණවල තොරතුරු විවිධ විෂය ක්ෂේත්‍රයනට අදාළ වාරසඟරා මඟින් ප්‍රකාශයට පත් කරනු ලබයි. එවැනි තොරතුරුවල ඇති වැදගත්කම ගැන විශ්වවිද්‍යාලයීය සිසුන් දැනුවත් කොට වැඩි කාලයක් වාර සඟරා කියවීම කෙරෙහි ඔවුන් පෙලඹවීමේ වැඩපිළිවෙළක අවශ්‍යතාවක් වර්තමානයේ පවතී.

පුස්තකාලයීය කාර්ය මණ්ඩලය ද පාඨකයාගේ පුස්තකාලයීය භාවිතය වැඩිකිරීම කෙරෙහි යම්කිසි කාර්ය භාරයක් ඉටුකළ හැකි ය. ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීම හා පාඨකයා හා කාර්ය මණ්ඩලය අතර සුහදතාව ආරක්ෂාකිරීම විශේෂයෙන් ම වැදගත් වේ. පුස්තකාලයීය සම්පත් පරිහරණයේ දී ඒවාට ඇති තාක්ෂණික මෙවලම් වන වර්ගීකරණ ක්‍රම පුස්තකාලයීය සුචි පිළිබඳ ව දැනුම ලබාදීමේ දී මෙම සුහදතාව විශාල වගකීමක් ඉටුකරනු ලබයි.

## පරිශීලිත මූලාශ්‍රයෝ


Devarajan, G. (1994) Role of libraries in education, NewDelhi, Becon book.

Otike, J. (1999) The information needs and seeking habit lawyers in England, Information and Library review, v. 31.

Rathnayake, A.R.M.M. (2004) Library user education programmes in Sri Lankan universities, Journal of the University Librarians' Association of Sri Lanka, v. 8.

Shoham, S. and Yatzhaki, M. (1991). The effect of some input factors on school library use, International library review, v. 41.

Silva, H. (1978) Reading habits of teacher trainee students in sinhala medium training colleges. (M.A. Dissertation) Nugegoda, University of Sri Jayawardanepura.